# සෞඛ්‍යආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය

## ඒඩ්ස් රෝගය, ක්ෂය රෝගය සහ මැලේරියා රෝගය මර්දනය කිරීම සඳහා පිහිටුවා ඇති ගෝලීය අරමුදලේ ආධාර වලින් ශ්‍රී ලංකාවේ දියත් කොට ඇති ව්‍යාපෘතිය

මෙම අමාත්‍යාංශය වෙත ඉහත කී අරමුදලෙන් ජාතික ක්ෂය රෝග, මැලේරියා සහ එච්අයිවී / ඒඩ්ස් රෝග මර්දන වැඩ සටහන් ශක්තිමත් කිරීම සඳහා මූල්‍යමය ආධාර ලැබී ඇත.

එම අරමුදල කළමනාකරණය සඳහා අමාත්‍යාංශයේ පිහිටුවා ඇති ඒකකයේ සේවය කිරීම සඳහා පහත සඳහන් තනතුරට ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ගණකාධිකාරීවරයෙකු සඳහා පුරප්පාඩු - කොන්ත්‍රාත් පදනම මත

ඉහත සඳහන් අරමුදලේ ආධාර ඇතිව සෞඛ්‍ය අමාත්‍යංශයේ අදළ රෝග මර්දන වැඩ සටහන් මගින් පවත්වාගෙන් යනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් මූල්‍යමය කටයුතු පාලනය කිරීම සඳහා සුදුසුකම් ලත් ගණකාධිකාරීවරයෙකුගේ පූර්ණකාලීන සේවාව අවශ්‍ය වී ඇත. මෙම නිලධාරියාගේ සේවා ස්ථානය කොළඹ වන අතර අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී තැන සහ අදළ රෝග මර්දන ව්‍යාපාරවල අධ්‍යක්ෂවරුන් සමග සම්බන්ධීකරණයට භාජනව ව්‍යාපෘති අධ්‍යක්ෂ යටතේ සේවය කරනු ඇත.

### සුදුසුකම්

1. වරලත් ගණකාධිකාරීවරයෙකු හෝ CIMA සුදුසුකම් ලත් ගණකාධිකාරීවරයෙකු විය යුතුය.
2. පරිගණක පාවිච්චිය පිළිබඳ පළපුරුද්ද (MS Word, Excel ඇතුළු office Software Packages)
3. ඉංග්‍රීසි භාෂාව (වාචික සහ ලිඛිත) භාවිතය පිළිබඳව මනා පළපුරුද්ද.
4. ගණකාධිකාරීවරයෙකු ලෙස අවම වශයෙන් අවුරුදු 3 ක පළපුරුද්ද, විදේශීය ආධාර වලින් පවත්වාගෙන යන ව්‍යාපෘති වල සේවය කළ අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

### සේවා කොන්දේසි

1. ව්‍යාපෘතියේ මුදල් කළමනාකරණ කටයුතු පිළිබඳව භාරව සිටීම
2. අවශ්‍ය වාර්තා පවත්වාගෙන යාම.
3. දිස්ත්‍රික් මට්ටමේ ව්‍යාපෘති නිලධාරීන් සඳහා අවශ්‍ය මුදල් කලට වේලාවට ලබාදීම.
4. දිස්ත්‍රික්වලින් ලැබිය යුතු ගෙවීම් පිළිබඳ ලේඛන සහ වාර්තා කලට වේලාවට ගෙන්වා ගැනීම.
5. දිස්ත්‍රික් මට්ටමේ ව්‍යාපෘති මුදල් වියහියදම් ගැන පරීක්ෂාකාරීවීම
6. ත්‍රෛමාසික/ අර්ධ වාර්ෂික මුදල් වියහියදම් පිළිබඳ වාර්තා ගෝලීය අරමුදල වෙත සැපයීම.

**වයස සීමාව** : අවුරුදු 57 අඩු විය යුතුය. ( 2009 මැයි මස 01 දිනට)

**මාසික වේතනය** : මසකට රු. 55,000/= (2009 මැයි මස 01 දිනට)

### සාමාන්‍ය කොන්දේසි.

- ව්‍යාපෘතිය අවු. 5 ක් සඳහා සැළසුම් කර ඇත. කොන්ත්‍රාත් කාලසීමාව පළමුව එක් වර්ෂයක් වන අතර, නැවත දීර්ඝ කිරීමේ හැකියාව තිබේ.
- ඉල්ලුම්කරුවන් අතරින් තෝරාගත් ඉල්ලුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ඇත. තෝරාගත් ඉල්ලුම්කරු වහාම සේවය ආරම්භ කිරීමට එකඟ විය යුතුයි.

### අනෙකුත් වරප්‍රසාද

- අර්ථ සාධක අරමුදල සඳහා වැටුපෙන් 12% ක් ද සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා වැටුපෙන් 3% ක් ද සේවා යෝජකයා විසින් ප්‍රදනය කරනවා ඇත. සේවාදයකයා විසින් වැටුපෙන් 8% ක් ප්‍රදනය කළ යුතුය.
- දැනටමත් රාජ්‍ය සේවයට අනුයුක්ත ඉල්ලුම්කරුවන් තමන්ගේ ඉල්ලුම්පත් අදළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ තම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා මගින් එවිය යුතුවන අතර ඉල්ලුම්කරු තෝරා ගනු ලැබුවේ නම් දැනට සිටින තනතුරෙන් මුදවා හැරිය හැකි දැයි අදළ නිලධාරීන් විසින් සඳහන් කළ යුතුය.

ඉල්ලුම්කරු විසින් ඔහුගේ සුදුසුකම්, පළපුරුද්ද හා අනෙකුත් අදළ විස්තර අඩංගු ඉල්ලුම් පතක් 2009-05 මස12 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ව්‍යාපෘති අධ්‍යක්ෂ, GFATM ව්‍යාපෘති කාර්යාලය, 3 වන මහල, මහජන සෞඛ්‍ය සංකීර්ණ ගොඩනැගිල්ල, නො.555/5, ඇල්විටිගල මාවත, කොළඹ 05 වෙත එවිය යුතුය. ඉල්ලුම්පත් සීල් කරන ලද කවරයක බහා එවිය යුතු වන අතර කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "**GFATM ව්‍යාපෘතිය - ගණකාධිකාරී තනතුර සඳහා ඉල්ලුම් කිරීම**" ලෙස සඳහන් කළ යුතුය.


**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**GFATM ව්‍යාපෘති කාර්යාලය, 3 වන මහල,**
**මහජන සෞඛ්‍ය සංකීර්ණ ගොඩනැගිල්ල,**
**නො.555/5, ඇල්විටිගල මාවත, කොළඹ 05.**

**දුරකථන : 2581918**
**ෆැක්ස් : 2368885**
**ඊමේල් : gfatmprojoff@sltnet.lk**